කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

*දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

**ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2024**

**ජූනි - 2026**

**BMGTE 2065 - සංවිධාන න්‍යාය හා සැකැස්ම**

ප්‍රශ්න සංඛ්‍යාව : අටයි (08) කාලය: පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න අංක **01**

(අ). නවීන සංවිධාන සඳහා සංවිධාන න්‍යාය හා සංවිධාන සැලසුම අධ්‍යයනය කිරීම වැදගත් වන්නේ ඇයිදැයි විස්තර කරන්න. සංවිධාන න්‍යාය පිළිබඳ දැනුම කළමනාකරුවන්ට සංවිධාන කාර්යක්ෂමතාව සහ කාර්යසාධනය වැඩිදියුණු කිරීමට උපකාරී වන ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(ආ) සංවිධානයක සන්දර්භීය මාන (Contextual Dimensions) සහ ව්‍යුහාත්මක මාන (Structural Dimensions) අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න. ඔබගේ පිළිතුරට සුදුසු උදාහරණ ඇතුළත් කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක **02**

ABC Manufacturing (Pvt) Ltd. යනු ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ක්ෂේත්‍රයට අයත් සමාගමකි. එය වසර 15කට පෙර සේවකයින් 15 දෙනෙකු සමඟ ආරම්භ කරන ලදී. ආරම්භක අවධියේදී සමාගමේ නිර්මාතෘවරයා සියලුම සේවකයන් අධීක්ෂණය කළ අතර සියලුම ප්‍රධාන තීරණ ගත්තේද ඔහුය.
ව්‍යාපාරයේ වර්ධනයත් සමඟ අද වන විට සමාගම සේවකයින් 300කට අධික සංඛ්‍යාවක් සේවයේ යොදවා ඇති අතර මානව සම්පත්, මූල්‍ය, නිෂ්පාදන, අලෙවිකරණ සහ තත්ත්ව පාලන යන වෙනම දෙපාර්තමේන්තු ස්ථාපිත කර ඇත.

මෙහෙයුම් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සඳහා සමාගම නිල නීති, ක්‍රියාපටිපාටි, වාර්තාකරණ සබඳතා සහ කළමනාකරණ මට්ටම් කිහිපයක් හඳුන්වා දී ඇත. බොහෝ තීරණ සඳහා ඉහළ කළමනාකාරිත්වයේ අනුමැතිය අවශ්‍ය වේ.

මෑතකදී සේවකයන් තීරණ ගැනීමේ ප්‍රමාදය, අධික ලේඛන කටයුතු, දෙපාර්තමේන්තු අතර දුර්වල සන්නිවේදනය සහ නව අදහස් ඉදිරිපත් කිරීමට ඇති සීමිත අවස්ථා පිළිබඳව පැමිණිලි කර ඇත. එමෙන්ම දෙපාර්තමේන්තු කළමනාකරුවන් දෛනික මෙහෙයුම් ගැටලු ස්වාධීනව විසඳීමට ප්‍රමාණවත් බලය නොමැති බව ද පෙන්වා දෙයි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාගම නවෝත්පාදන හැකියාවෙන් හා වෙළඳපොළ වෙනස්කම්වලට ප්‍රතිචාර දැක්වීමේ වේගයෙන් පසුබෑමකට ලක්ව ඇත.

(අ). සංවිධාන ව්‍යුහය පිළිබඳ සංකල්ප භාවිතා කරමින් ABC Manufacturing (Pvt) Ltd. හි වර්තමාන සංවිධාන ව්‍යුහය විශ්ලේෂණය කරන්න. සමාගම අනුගමනය කරන ව්‍යුහයේ වාසි සහ අවාසි සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(ආ). ABC Manufacturing (Pvt) Ltd. සඳහා වඩාත් සුදුසු සංවිධාන ව්‍යුහයක් නිර්දේශ කරන්න. ඔබගේ නිර්දේශය මගින් සන්නිවේදනය, තීරණ ගැනීම, නවෝත්පාදනය සහ සංවිධාන කාර්යක්ෂමතාව වැඩිදියුණු වන ආකාරය පැහැදිලි කරමින් සාධාරණීකරණය කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක **03**

(අ). සංවිධාන ජීවන චක්‍රයේ (Organizational Life Cycle) අවධීන් විස්තර කරන්න. එක් එක් අවධියේ ප්‍රධාන ලක්ෂණ, කළමනාකරණ ශෛලිය සහ මුහුණදෙන අභියෝග පැහැදිලි කරන්න. මෙම අවධීන් හරහා ගමන් කළ සංවිධානයක් උදාහරණයක් ලෙස භාවිතා කර ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ). අභ්‍යන්තර සහ බාහිර අභියෝග හේතුවෙන් සංවිධාන පිරිහීමේ (Decline) අවධියකට ලක්විය හැකිය. සංවිධානයක් එම පිරිහීමේ අවධියට ඇතුළුවීම වළක්වා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක **04**

(අ). අන්තර්-සංවිධානික සබඳතා (Inter-organizational Relationships) වල විවිධ ආකාරයන් වන උපායමාර්ගික සන්ධාන (Strategic Alliances), හවුල්කාරිත්වයන් (Partnerships), ඒකාබද්ධ ව්‍යාපෘති (Joint Ventures) සහ සංවිධාන ජාල (Organizational Networks) සුදුසු උදාහරණ සමඟ සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(ආ). අන්තර්-සංවිධානික සබඳතා පවත්වාගෙන යාමේ ප්‍රතිලාභ සහ අභියෝග සාකච්ඡා කරන්න. එවැනි සබඳතා සංවිධාන සාර්ථකත්වයට දායක වන ආකාරයත්, ඒ සමඟම කළමනාකරණ හා මෙහෙයුම්මය දුෂ්කරතා ඇති කළ හැකි ආකාරයත් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 05**

(අ). සංවිධානවල *පරිසර අවිනිශ්චිතතාවය (environmental uncertainty)* යන සංකල්පය පැහැදිලි කරන්න. පරිසර අවිනිශ්චිතතාවයට හේතු වන ප්‍රධාන සාධක සාකච්ඡා කරමින්, සුදුසු සංවිධාන උදාහරණ ලබා දෙන්න.

(ලකුණු 10)

(ආ). "සංවිධාන ව්‍යුහය පරිසර අවිනිශ්චිතතාවයේ මට්ටමට අනුකූලව සකස් විය යුතුය."
මෙම ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරමින්, අඩු, මධ්‍යම සහ ඉහළ පරිසර අවිනිශ්චිතතාවය යටතේ සංවිධාන ව්‍යුහය කෙසේ වෙනස් විය යුතුද යන්න පැහැදිලි කරන්න. සුදුසු උදාහරණද සපයන්න.

*(ලකුණු 10)*

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 06**

(අ). සංවිධානවල *මූලික තාක්ෂණය (core technology)* සහ *මූලික* නොවන *තාක්ෂණය (non-core technology )* විවේචනාත්මකව සංසන්දනය කරන්න. ඔබගේ පිළිතුරේදී ඒවායේ අර්ථය සහ ඒවාට අදාළ ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ). සුදුසු ආකෘතියක් (model) සමඟ *තාක්ෂණික සංකීර්ණතාවය (Technological Complexity)* යන සංකල්පය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 07**

(අ). සංවිධානයක *ජාත්‍යන්තර සංවර්ධනයේ අදියර* පැහැදිලි කරන්න. ඔබගේ පිළිතුරේදී එක් එක් අදියරේ ප්‍රධාන ලක්ෂණ සාකච්ඡා කරමින්, සුදුසු සංවිධාන උදාහරණ සමඟ ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ). ජාත්‍යන්තර සංවිධාන විසින් භාවිතා කරනු ලබන ව්‍යුහාත්මක ආකෘති **(Structural Models)** විවේචනාත්මකව විමසා බලන්න. ඔබගේ පිළිතුරේදී ප්‍රධාන ව්‍යුහාත්මක ආකෘතිවල ප්‍රධාන **ලක්ෂණ, වාසි සහ සීමාවන්** පැහැදිලි කරමින්, සුදුසු සංවිධාන උදාහරණ භාවිතයෙන් ඔබගේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක **08**

(අ). සංවිධාන සංස්කෘතියේ ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරමින්, විවිධ සංවිධාන සංස්කෘති වර්ග සංවිධාන ව්‍යුහය සහ සංවිධාන කාර්යක්ෂමතාව කෙරෙහි බලපාන ආකාරය සුදුසු උදාහරණ භාවිතයෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(ආ). සංවිධානවල ව්‍යුහයට සහ සැකැස්මට බලපාන, වර්තමානයේ සංවිධාන මුහුණ දෙන ප්‍රධාන සමකාලීන ගැටලු සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**